Sri Lanka Tourism

Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.
www.sltda.gov.lk / www.srilanka.travel , Tel: +94 112 426 800/900

**කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ විදේශ සංචාරකයන්ට අනිවාර්ය කොට ඇති රක්ෂණ ක්‍රමය පිළිබඳ පැහැදිලි කිරීම**

සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ සංචාරක සංවර්ධන අධිකාරිය විසින්, කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙරටට පැමිණෙන විදේශ සංචාරකයන්ට අනිවාර්ය කොට ඇති රක්ෂණ ක්‍රමය පිළිබඳ විවිධ පුවත් මේ දිනවල සමාජ මාධ්‍යයන්හි දක්නට ලැබේ.

මේ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් සිදු කිරීමක් පහත දැක්වේ.

අංක PED/ITIT/INCM/pro හා 2019.09.12 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, රක්ෂණ සේවා සැපයීම සඳහා සෘජුව සේවා දායකයින්ගේ සේවය ලබාගැනීමට රාජ්‍ය ආයතනයකට හැකියාවක් නොමැත. මේ අනුව සංචාරක සංවර්ධන අධිකාරිය 2020 දෙසැම්බර් මාසයේදී, ජාතික රක්ෂණ නියාමන කොමිසමෙහි ලියාපදිංචි, වෛද්‍ය රක්ෂණ ලබාදෙන සියලුම ආයතන වෙතින් ලංසු කැඳවන ලදී. මෙහිදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි, පරිපාලන හා ප්‍රවර්ධන වියදම් සඳහා ඇ.ඩො. 3ක මුදලක් සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලබා දිය යුතුය යන කොන්දේසිය දක්වා තිබිණි.

නියමිත කාලය තුළදී මේ සඳහා ලංසු 4 ලැබී තිබුණු අතර, ඒ අතුරින් People’s Insurance PLC සමාගම වෙත මෙම ලංසුව පිරිනැමීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී. People’s Insurance PLC යනු වැඩි කොටස් මහජන බැංකුව සතු, රාජ්‍ය හිමිකාරිත්වය සහිත, විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් සමාගමකි.

මෙහිදී ඔවුන් ඉහත කොන්දේසිය පරිදි ඇ.ඩො. 3ක් සහ අමතර ඇ.ඩො.0.5ක් පරිපාලන හා ප්‍රවර්ධන වියදම් ලෙස සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලබා දීමට එකඟතාවය පළ කර තිබිණි.

මේ අනුව People’s Insurance PLC සමාගම සංචාරකයන් සඳහා ඇ.ඩො.8.5 ක මිළකට ඇ.ඩො. 50,000 ක කෝවිඩ් රක්ෂණාවරණයක් ලබා දුන් අතර, මේ වන විට එම මුදලටම එම ප්‍රතිලාභය ඇ.ඩො. 75,000 දක්වා ඉහළ නංවා ඇත.

ඉහත අයුරින් සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලද ඇ.ඩො. 3.5 ක මුදල නියමිත පරිදි ගිණුම්ගත කොට, සංචාරක ප්‍රවර්ධන කටයුතු සහ සේවක සුභසාධනය ඇතුලු පරිපාලන කටයුතු සඳහා යොදා ගනු ලැබේ.